ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය**

**මාර්ග සංවර්ධන අධිකාරිය**

# ලංසු ආරාධනයයි

## මාර්ග සංවර්ධන අධිකාරියේ ඉදිකිරීම් කටයුතු සඳහා

1. **මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) ගම්පහ විධායක ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා** විසින් පහත බෝක්කුව නැවත ඉදිකිරීම සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

| **කොන්ත්‍රාත් අංකය** | **විස්තරය** | **ලංසු සුරක්ෂණය** |
|---|---|---|
| RDA/GAM/EE/TEN/2025/15 | කිරිබත්ගොඩ - සපුගස්කන්ද මාර්ගයේ අංක ½ බෝක්කුව නැවත ඉදිකිරීම. | රු. 100,000.00 |

2. ක්‍රියාත්මක කරන නියෝජිතායතනය වන්නේ **මාර්ග සංවර්ධන අධිකාරියේ ගම්පහ විධායක ඉංජිනේරු කාර්යාලයයි.**

3. ජාතික තරඟකාරී ලංසු ක්‍රමය(NCB) අනුගමනය කරනු ලැබේ. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) C8 ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන් සඳහා අයදුම්පත් යොමු කළ හැක.
4. **සෑම ලංසුවක්ම දක්වා ඇති වටිනාකමට පිළිගත් බැංකුවකින් මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රධාන ඉංජිනේරු (ගම්පහ) නමට ලබාගත් ලංසු සුරක්ෂණයක් (2025.03.24 දක්වා වලංගු) සහිතව හෝ ගම්පහ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය වෙත මුදලින් තැන්පත් කොට ලබා ගන්නා ලදුපත ඉදිරිපත් කළ යුතුය.**ලංසු සුරක්ෂණ රහිතව ඉදිරිපත් වන ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
5. ලංසු, කැඳවීමේ අවසන් දිනයේ සිට **දින 77 දක්වා** වලංගු විය යුතුය.

6. 2025.02.10 සිට 2025.02.24 දින දක්වා පෙ.ව. 09.00 සහ ප.ව. 03.00 අතර කාලය තුළ නැවත ගෙවනු නොලබන රු. 1,180.00 (වැට් සහිත) අයදුම්පත් ගාස්තුවක් ගෙවා **ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, මිරිස්වත්ත, මුදුන්ගොඩ** වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය.ලංසු ලේඛනය මිලදී ගන්නා විට මුල් ගෙවීම් පත්‍රිකාව ඉදිරිපත් විය යුතුය.**2025.02.25 දින .ව. 2.30 ට ලංසු භාරගැනීම අවසන් වේ.** ලංසු භාර ගැනීම අවසන් වූ වහාම විවෘත කෙරෙණු ඇත. ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයකුට දැනුම් දෙනු ලැබේ.

7. විධායක ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, බිම් මහල, මිරිස්වත්ත, මුදුන්ගොඩ වෙතින් ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය.
8. මුද්‍රා තබන ලද ලංසු, **පිටපත් දෙකකින්** යුතුව සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව, විධායක ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, බිම් මහල, මිරිස්වත්ත, මුදුන්ගොඩ වෙත, අවසන් දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදී ලැබීමට සැලස්විය යුතුය.කරුණාකර සෑම ලංසුවකම ඉහල වම් කෙළවරේ **ටෙන්ඩර් අංකය හා ටෙන්ඩරයේ නම** සඳහන් කල යුතුය.

9. වැඩිදුර විස්තර සඳහා කරුණාකර දුරකථන අංක 033-2225033 ඔස්සේ කාර්යාල වේලාවන්හි දී විධායක ඉං ජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය අමතන්න.

**සභාපති,**
**ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව, විධායක ඉංජිනේරු කාර්යාලය**
**මාර්ග සංවර්ධන අධිකාරිය - ගම්පහ**